# 2.2 සහසංයුජ හා ධ්‍රැවීය සහසංයුජ අණුවල හා සරල අයනවල හැඩ විග්‍රහ කිරීම.

- සම්මත නීති භාවිතයට ගනිමින්, සුලබව හමු වන උපරිම වශයෙන් පරමාණු 10 කට සීමා වන සහසංයුජ අණුවල හා අයනවල සම්ප්‍රයුක්ත ව්‍යුහ ඇඳීම.
- සම්ප්‍රයුක්තතාව භාවිත කර ඕසෝන් අණුවේ හා කාබනේට් අයනයේ බන්ධන දිගෙහි සමානත්වයට හේතු පැහැදිලි කිරීම.
- පරමාණුවක කාක්ෂික අතිච්ඡාදනය පැහැදිලි කිරීම.
- සුදුසු නිදසුන් භාවිතයෙන් මධ්‍යම පරමාණුවේ sp, $sp^2$ හා $sp^3$ යන මුහුම්කරණ සිදු වන ආකාරය විස්තර කිරීම.
- s-s, s-p හා p-p පරමාණුක කාක්ෂිකවල රේඛීය අතිච්ඡාදනයෙන් සිග්මා බන්ධන සාදන බව සඳහන් කිරීම.
- p කාක්ෂික දෙකක් අතර පාර්ශ්වික අතිච්ඡාදනයෙන් (pi bonds) බන්ධන සෑදෙන බව සඳහන් කිරීම.
- සිග්මා හා pi බන්ධනවල ප්‍රබලතාව සන්සන්දනය කිරීම.
- මුහුම් කාක්ෂික අතිච්ඡාදනයෙන් සිග්මා බන්ධන සෑදීම විස්තර කිරීම.
- (VSEPR) වාදය භාවිත කර අණුවල හා අයනවල කේන්ද්‍රීය පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් දිශානුගත වී ඇති ආකාරය (ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය) හා ඒවායේ හැඩය (අණුක ජ්‍යාමිතිය) පුරෝකථනය කිරීම.
- විවිධ අණුවල බන්ධන කෝණ සැසඳීම.(බන්ධන කෝණවල සැබෑ අගයන් පරීක්ෂා නො කෙරේ)
- හැඩ විදහා දැක්වීම සඳහා අණුවල ආකෘති තැනීම.
- මුහුම්කරණය ඔක්සිකරණ අංකය හා ආරෝපණය පදනම් කර ගෙන විද්‍යුත් සෘණතාව විචලනය වන අයුරු විස්තර කිරීම. (ගුණාත්මක ව පමණි)